## උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ ( උ.මා.ස.ව්‍යා.) - සාමාන්‍ය මෙහෙයුම්- 2011

---

### 1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර , මාගේ මතය වනුයේ ,

(අ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2011 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වී ඇති බවත්ය.

### 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශනවලට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම, රු.2,275,114,421 ක් වූ අතර 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.2,276,263,846 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් මාස දෙකක කාලපරිච්ඡේදය සඳහා වියදම හා 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශ කර පහත දැක්වේ.

| වියදම් විෂයය | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2010 ඔක්තෝබර් 22 සිට 2010 දෙසැම්බර් 31 දක්වා වූ පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වියදම | 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කාර්යාලීය උපකරණ | 1,100,215 | - | 1,100,215 |
| සිවිල් වැඩ | 2,087,182,261 | - | 2,087,182,261 |
| අධීක්ෂණ උපදේශකවරු | | | |
| - ජාතික මහා මාර්ග | 56,237,195 | - | 56,237,195 |
| - පළාත් | 79,553,021 | - | 79,553,021 |
| සමීක්ෂණ / පරීක්ෂණ ගාස්තු | 1,053,376 | - | 1,053,376 |
| වර්ධක වියදම | 24,881,124 | - | 24,881,124 |
| පොලී / බැඳීම් ගාස්තු | 23,477,229 | 1,149,425 | 24,626,654 |
| තැන්පතු සහ අත්තිකාරම් | 1,630,000 | - | 1,630,000 |
| | 2,275,114,421 | 1,149,425 | 2,276,263,846 |

## 2.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා එදිනට එම ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| ආරම්භක අග්‍රිම | 135,098.89 | 14,960,994 |
| එකතු කළා - ඌන පූර්ණයන් | 136,134.49 | 14,958,235 |
| විදේශ විනිමය වාසිය | - | 180,154 |
| | 271,233.38 | 30,099,383 |
| අඩුකළා - ආපසු ගැනම් | 244,105.77 | 27,009,513 |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | 27,127.61 | 3,089,870 |

## 3. විගණන නිරීක්ෂණ

--------------------

### 3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද එකතුව රු.1,659,798,683 ක් වු වැඩ පුර්ව අත්තිකාරම් මුල්‍ය ප්‍රකාශන වල වෙනම හෙළිදරව් කර නොතබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අයකර ගන්නා ලද රඳවා ගැනීම් මුදල් මුල්‍ය ප්‍රකාශන වල වෙනම හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) අදාල බලධාරීන්ගෙන් තක්සේරු සහතිකයක් ලබාගැනීමෙන් තොරව වර්ෂ 1 ක කාල පරිච්ඡේදයක් සඳහා කාර්යාල ගොඩනැගිල්ලේ කුලී අත්තිකාරම් ලෙස රු.2,400,000 ක මදලක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.

### 3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

2011 වර්ෂය තුළදී කොන්ත්‍රාත් පැකේජ් 10 ක් සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව ( CAPC) සහ තාක්ෂණ ඇගයීම් කමිටු ( TEC) රැස්වීම් වලට සහභාගීව හා සහාය කටයුතු සිදුකළ නිලධාරීන් 13 දෙනෙකුට එකතුව රු.935,000 ක් වු දීමනා ගෙවා තිබුණද , රැස්වීම් දෙකක පමණක් විස්තර ඉදිරිපත් කර තිබුණු අතර, එම රැස්වීම් වලට සහභාගී නොවු නිලධාරීන් කිහිපදෙනෙකුට ද දීමනා ගෙවා තිබු බව නිරීක්ෂණය විය.

### 3.3 වත්කම් උපයෝජනය

----------------------

සමාලෝචිත වර්ෂය තුළ වටිනාකම රු.129,300 කට මිලදී ගන්නා ලද පරිගණක හා උපාංග 2012 මැයි 30 දින වන විටත් උපයෝජනය කිරීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

### 3.4 අරමුදල් උපයෝජනය

----------------------

2011 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු අනුව ශීර්ෂ 117 - වරාය හා මහා මාර්ග අමාත්‍යාංශය , වැඩ සටහන 02 සහ ව්‍යාපෘති 04 යටතේ මෙම ව්‍යාපෘතිය සඳහා රු.5,000,000,000 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ කටයුතු වෙනුවෙන් රු.2,275,114,421 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.5 සැලසුම් කිරීම හා අධීක්ෂණය

ලී බඩු , කාර්යාල උපකරණ හා පරිගණක මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.1,121,851 ක මුදලක් වැයකර තිබුණද , ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 3.6 කාර්ය සාධන සමාලෝචනය

විගණනයට ලබාගත හැකි වු තොරතුරු වලට අනුව 2012 අප්‍රේල් 30 දිනට කොන්ත්‍රාත් පැකේජ් 10 ක භෞතික කාර්ය සාධනය පර්දි වේ.

| කොන්ත්‍රාත් පැකේජ් | ආරම්භ කළ දිනය | නිම කිරීමට අපේක්ෂිත දිනය | 2012 අප්‍රේල් අවසානයට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| | | | % |
| ආර්ඩීඒ/එන්ආර්සීපී/අයිසීබී/ඒඩීබී/සීපී-1 | 2011 ජුනි 07 | 2012 නොවැ. 28 | 15.80 |
| ආර්ඩීඒ/එන්ආර්සීපී/අයිසීබී/ඒඩීබී/සීපී- 2 | 2011 ජුනි 07 | 2012 නොවැ. 28 | 18.40 |
| ආර්ඩීඒ/එන්ආර්සීපී/අයිසීබී/ඒඩීබී/සීපී- 3 | 2011 ජුනි 07 | 2012 අගෝ. 30 | 19.60 |
| ආර්ඩීඒ/එන්ආර්සීපී/අයිසීබී/ඒඩීබී/සීපී- 4 | 2011 ජුනි 07 | 2013 ජන. 27 | 41.00 |
| ආර්ඩීඒ/එන්ආර්සීපී/අයිසීබී/ඒඩීබී/සීපී- 5 | 2011 ජුනි 07 | 2012 නොවැ. 28 | 50.80 |
| ආර්ඩීඒ/එන්ආර්සීපී/අයිසීබී/ඒඩීබී/සීපී- 6 | 2011 ජුනි 07 | 2013 මැයි 27 | 27.00 |
| ආර්ඩීඒ/එන්ආර්සීපී/අයිසීබී/ඒඩීබී/සීපී- 7 | 2011 ජුනි 07 | 2012 නොවැ. 28 | 51.60 |
| ආර්ඩීඒ/එන්ආර්සීපී/අයිසීබී/ඒඩීබී/සීපී- 8 | 2011 ජුනි 07 | 2012 නොවැ. 28 | 27.00 |
| ආර්ඩීඒ/එන්ආර්සීපී/අයිසීබී/ඒඩීබී/සීපී- 9 | 2011 ජුනි 07 | 2012 නොවැ. 28 | 40.50 |
| ආර්ඩීඒ/එන්ආර්සීපී/අයිසීබී/ඒඩීබී/සීපී- 10 | 2011 ජුනි 07 | 2012 නොවැ. 28 | 16.10 |

ඉහත කොන්ත්‍රාත්තු පැකේජ් 10 න් කොන්ත්‍රාත්තු පැකේජ 08 ක 2012 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. එයින් කොන්ත්‍රාත්තු කාලය 70% ක් ඉකුත් වී තිබුණද භෞතික ප්‍රගතිය 15% සිට 52% දක්වා පමණක් විය.